නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය
வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சு
Ministry of Housing & Samurdhi

4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4 வது மாடி செத்சிறிபாய பத்தரமுல்ல.
4 th floor, Sethsiripaya, Battaramulla.

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

මගේ අංකය / எனது இல / My No } ddd/HO/3/ACC/14/Dele.2015

ඔබේ අංකය / உமது இல / Your No } ..............................

දිනය / திகதி / Date } 2015.05

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන්.
සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
අධ්‍යක්ෂ ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය,
පුහුණු මධ්‍යස්ථාන භාර නිලධාරීන්.

## ගිණුම් උපදෙස් හා මූල්‍ය පාලනය පිළිබඳ බලතල පැවරීම - 2015

ගිණුම් උපදෙස් හා මූල්‍ය පාලනය පිළිබඳ බලතල පැවරීම - 2015 සම්බන්ධව නිකුත් කරන ලද 2015.05.05 දිනැති අංක DDD/HO/3/ACC/14/DELE.2015 දරණ චක්‍රලේඛය හා බැඳේ.

එම චක්‍රලේඛයේ පහත සඳහන් ඡේද වලට අදාල උපදෙස් ඉදිරියෙන් දක්වා ඇති පරිදි සංශෝධනය කිරීම අනුමත කරමි.

| ඡේදය | සිදුකරනු ලබන සංශෝධන |
|---|---|
| 4 - බැංකු ගිණුම් මෙහෙයවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් | ප්‍රාදේශීය මට්ටම යටතේ සමාජ සංවර්ධන අරමුදල මෙහෙයවීමේ නිලධාරි වශයෙන් ප්‍රාදේශීය ලේකම් කටයුතු කරන අතර එම ගිණුමෙන් මුදල් නිදහස් කිරීම ප්‍රාදේශීය ලේකම් හා කළමණාකාර අධ්‍යක්ෂක විසින් සිදුකල යුතුය. |
| 8 - අතිකාල, නිවාඩු දින වැටුප්, ගමන් වියදම් සහ අමතර රාජකාරි සඳහා දීමනා ගෙවීම | දිවිනැගුම සංවර්ධන නිලධාරීන් (කාර්යාලගත) - ඒකාබද්ධ අරමුදලෙන් ගෙවිය යුතු මාසික උපරිම පැය ගණන පැය 20 කි. එම නිලධාරීන් සඳහා බැංකු අරමුදලින් ගෙවීම් නොකල යුතුය.<br>දිවිනැගුම සහනාධාර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන දිස්ත්‍රික් මට්ටමේ සහ ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් විසින් දරණු ලබන වගකීම සඳහා පහත සඳහන් පරිදි මාසික දීමනාවක් ගෙවිය යුතුය.<br>නිලධාරියාගේ තනතුර / රජයේ අරමුදලින් / බැංකු අරමුදලින්<br>1.දිස්ත්‍රික් ලේකම් — 2500/-<br>2.ප්‍රාදේශීය ලේකම් — 1500/-<br>3.දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ගණකාධිකාරි නොමැති අවස්ථාවල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි වැඩ බලන විට — 1750/-<br>4.ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරි — — 1000/-<br>5.සරප් - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය — 300/- |
| 12 - වියදම් දැරීම සඳහා අධිකාරි බලය හා සීමාවන් | සුළු වටිනාකම් සහිත භාණ්ඩ හා සේවා සෘජු මිලදී ගැනීම් - අධ්‍යක්ෂ ජනරාල් රු. 200,000 දක්වා පැවරූ බලයට අතිරේක වශයෙන්<br>දිස්ත්‍රික් ලේකම් - රු. 50,000 දක්වා සහ<br>ප්‍රාදේශීය ලේකම් - රු. 25,000 දක්වා<br>අධ්‍යක්ෂ ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය රු. 10,000/- දක්වා |

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர் நாயகம் / Additional Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| දුරකථන/ தொலைபேசி/Telephone: | 011-2872202 | 011-2861994 | 011-2873799 | 011-2889046 |
| ෆැක්ස්/ தொலைநகல்/Fax: | 011-2889002 | | 011-2873996 | 011-2887722 |
| ඊ-මේල්/ மின்னஞ்சல்/ E-Mail: | dgdivineguma@gmail.com | anuradhakum@yahoo.com | hrddivineguma@gmail.com | |

| | |
|---|---|
| 14 - තත්කාර්ය අතුරු අග්‍රිම | විශේෂ අවස්ථාවලදී මු.රෙ 371 අනුව රු. 20,000 කට නොවැඩි තත්කාර්ය අතුරු අග්‍රිමයක් දිස්ත්‍රික් ලේකම්ගේ හෝ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය යටතේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකුට නිකුත් කල හැකිය |
| 15 - වාහන යන්ත්‍ර හා උපකරණ අළුත්වැඩියා, නඩත්තු | දිස්ත්‍රික් මට්ටමේ වාහන අළුත් වැඩියා කිරීම ඡේද 12 යටතේ වියදම් දැරීම සඳහා අධිකාරි බලය හා සීමාවන් අනුව දිස්ත්‍රික් ලේකම්වරුන්ට හා ප්‍රාදේශීය ලේකම් වරුන්ට සිදුකල හැකිය. වාහන අළුත් වැඩියාවේ වටිනාකම රු. ලක්ෂ දෙක ඉක්ම වන්නේනම් අළුත් වැඩියාවට පෙර ඒ සඳහා නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. |

නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය යටතේ ස්ථාපිත ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ 2015 වර්ෂයේ වියදම් දැරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වැය ශීර්ෂ 331 දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ඇස්තමේන්තු කර ඇති බැවින් එම ආයතනය වෙනුවෙන් මුදල් රෙගුලාසි 135 යටතේ බලතල පැවරීමේ ලේඛණයක් මෙයට ඇමුණුම 1 වශයෙන් ඉදිරිපත් කර ඇත.

මුල් චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් උපදෙස් නොවෙනස්ව පවතින අතර වෙන්කර ඇති ප්‍රතිපාදනය තුල වියදම් කළමණාකරණය කරගත යුතුබව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ධම්මික ගුණවර්ධන
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)

පිටපත් :-
01. ලේකම් - නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය - කා.දැ.පි.
02. විගණකාධිපති - කා.දැ.පි.
03. අධ්‍යක්ෂ ජනරාල් - -කළමණාකරන හා විගණන දෙපාර්තමේන්තුව - කා.දැ.පි.
04. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - කා.දැ.පි.
05. ප්‍රධාන අභ්‍යන්තර විගණක - කා.දැ.පි.